## ❖ *මේ බාල ගල් අඟුරු මගඩිය "දිනනතුරු සිල්වයි කුමාරවරු දෙන්නයි" එකට එක් වෙලා කරපු ඉතිහාසගත වෙන හොරකමක්...*

## ❖ *එදා පවුල් වාදයට එරෙහිව දේශපාලනය කළ ටිල්වින්ලා - අනුරලා අද ඩඩ්ලිලාගේ ධම්මිකලාගේ ගජමිතුරුවාදයට පාර කපනවා...*

අවුරුදු 76 ක් මේ රට පාලනය කළ කුමාරවරුන්ට වඩා 78 වැනි අවුරුද්දේ මේ රට පාලනය කරන කුමාරවරු ආර්ථික මය වශයෙන් "ගිලන්ව සිටින මේ රට" සුවපත් කරන්නට භාරගෙන ඉතිහාසයේ කවරදාවක් නැති අන්දමට වංචාව, දූෂණය හා හොරකම රජ කරවන්නට පටන් ගෙන ඇතැයි විමල් වීරවංශ මහතා චෝදනා කරයි.

ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මහතා මේ බැව් කියමින් දූෂිත නොරොච්චෝලේ ගල් අඟුරු හොරකමෙහි වර්තමාන බේදවාචකය මාධ්‍ය ඉදිරියේ පැහැදිලි කර පෙන්වා දෙමින් කීවේ, ජනතා විමුක්ති පෙරමුණේ මහ ලේකම් ටිල්වින් සිල්වා සහ විදුලි බල විෂය භාර අමාත්‍යවර කුමාර ජයකොඩි මෙන්ම ජනාධිපති අනුර කුමරුද මෙම දූෂිත ගනුදෙනු වලට සෘජුවම හවුල් වී ඇති බවයි....

ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මහතා පවසන පරිදි, ශ්‍රී ලංකාවේ මෑත ඉතිහාසයේ සිදුවූ විශාලතම මූල්‍ය වංචාවක් ලෙස "බාල ගල්අගුරු වංචාව" හඳුන්වා දෙයි. මෙම වංචාව නිසා රුපියල් කෝටි 800කට ආසන්න අලාභයක් දැනටමත් සිදුවී ඇති බව විදුලි බල මණ්ඩලය පෙන්වා දෙන බවත්, එය රටේ විදුලි පාරිභෝගිකයන්ගේ බරට පැටවෙන බවත් ඔහු පෙබරවාරි 22 වැනිදා පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවකදී අනාවරණය කළේය.

පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ විදුලිබල මණ්ඩලයේ වාර්තාවකට අනුව, මෙම බාල ගල්අගුරු ගණුදෙනුව නිසා දැනට සිදුවී ඇති අලාභය රුපියල් කෝටි 767ක් බව තක්සේරු කර ඇත.

"ඒ කියන්නේ ආසන්න වශයෙන් රුපියල් කෝටි 800ක් කියලා විදුලිබල මණ්ඩලය දැනට තක්සේරු කරලා තියෙනවා, දැනට ගොඩබාන ලද නැව් සංඛ්‍යාවට සාපේක්ෂව," යි වීරවංශ මහතා පැවසීය. මෙම

අලාභය ගණනය කර ඇත්තේ බාල ගල්අඟුරු නිසා නියමිත විදුලි ධාරිතාවය ජනනය නොවීමෙන් සිදුවන පාඩුව පමණක් ගණනය කරමින් බව ඔහු අවධාරණය කළේය.

"අනිත් කරුණු කිසිවක් පාඩුව සඳහා සලකා බලලා නැහැ. ඒ කියන්නේ මේ බාල ගල්අඟුරු නිසා පරිසරයට සිදුවෙන හානිය, නියමිත ප්‍රමාණයට වඩා වැඩියෙන් අලු පරිසරයට එකතු වෙන හානිය, නොරච්චෝලය අවට මිනිස්සුන්ගේ ජීවිතවලට ඒකෙන් වෙන හානිකර බලපෑම, ඊළඟට ඒ බාල ගල්අඟුරු දිගින් දිගටම පාවිච්චි කිරීම නිසා අනාගතයේදී විදුලිජනනය සිදු කරන ඒ බලාගාරයට වෙන්න පුළුවන් හානිය,"

ආදී කරුණු මෙම ගණනයට ඇතුළත් නොකර ඇති බව වීරවංශ මහතා සඳහන් කළේය. මෙම වංචාවේ බරපතලකම අවධාරණය කරමින් ඔහු පැවසුවේ, මෙම ගල්අඟුරු නැව් අටකම බාල තත්ත්වයේ බවත්, පසුගිය නැව් හතරට වඩා පස්වැනි සිට අටවැනි නැව් දක්වා තවත් බාල ගල්අඟුරු ගෙන ආ බවත් ය.

"පළමු නැව්වාර හතරට වඩා වැඩි පස්වෙනි නැවේ සිට අටවෙනි නැව දක්වා වූ ගල් අඟුරුවල බාල තත්ත්වය. අඩුගානේ මේක පළවෙනි දෙවෙනි නැව එනකොට මේක අනාවරණය වෙනවා. ශ්‍රී ලංකාවේ 'ලැබ් එකෙන් එන රිපෝට් එකේ' මේක බාල ගල්අඟුරු කියලා කියවෙනවා. එතකොටවත් අඩු ගානේ ඉන්දියානු සමාගමට බල කරන්න ඕන දකුණු අප්‍රිකාවෙන් හොඳ එක අරන් වරෙන් කියලා," යි ඔහු කීය.

ආණ්ඩුව මෙම වංචාව සඟවා ගැනීමට උත්සාහ කරන බවත්, විදුලිබල කුමරු (විදුලිබල අමාත්‍යවරයා), ජනාධිපති කුමරු (ජනාධිපතිවරයා) සහ ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා යන තිදෙනා මෙහි සම්බන්ධ බවත් ඔහු චෝදනා කළේය.

"දිනනතුරු සිල්වා ඒ නිසා තමයි පාදයක් ඉදිරියට තියලා විදුලි බල ඇමතිව රැක්කේ.... නෑ ගල් අඟුරු බාල වුනාට ඇමති බාල නෑ... එයා ඉන්න ඕනේ කියලා," යි වීරවංශ මහතා පැවසීය. මෙම වංචාවේ ප්‍රතිඵලයක් ලෙස රටේ කර්මාන්ත අංශය කඩාවැටෙමින් ඇති බවත්, MAS හෝල්ඩිංග්ස් වැනි සමාගම් කර්මාන්තශාලා වසා දමමින් ඇති බවත් ඔහු පෙන්වා දුන්නේය.

"දැන් ඇමෙරිකානු බදුනම් දැන් ඔය ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවත් එක්ක හැමෝටම 15% වුණානේ. නමුත් ඊට වඩා මේකේ පිරිවය වැඩියි. විදුලිබල පිරිවැය වැඩියි," යි වීරවංශ මහතා කීය.

අනාගතයේදී මෙම බාල ගල්අඟුරු භාවිතයෙන් නොරච්චෝල බලාගාරය අක්‍රිය වුවහොත් මාස හයකටත් වැඩි කාලයක් එය අලුත්වැඩියා කිරීමට ගතවන බවත්, එමගින් රටේ විදුලි ධාරිතාවයේ 40%ක් අහිමි වී

ඩීසල් භාවිතයට යොමු වීමෙන් විශාල වියදමක් දැරීමට සිදුවන බවත් ඔහු අනතුරු අඟවූය. මෙම බර අන්තිමේදී සාමාන්‍ය ජනතාව මත පැටවෙන බවත්, එයට එරෙහිව ජනතාව පෙළගැසිය යුතු බවත් ඔහු අවධාරණය කළේය.

මෙම සිදුවීම් රටේ ආර්ථික ස්ථාවරත්වයට බලපෑම් කරන බවත්, ආණ්ඩුවේ ප්‍රතිපත්තිවල දුර්වලතා පෙන්වන බවත් විපක්ෂයේ මතයයි. ආණ්ඩුව මෙම චෝදනාවලට තවමත් ප්‍රතිචාර දක්වා නොමැත.

## ***ධම්මික පෙරේරාට ගජමිතුරු සංග්‍රහ -***

## ***ශ්‍රී ලංකන් ගුවන් සේවයේ තීරණවලින්***

## ***රාජ්‍ය සම්පත් කොල්ලකෑමක්?***

ව්‍යාපාරික ධම්මික පෙරේරා මහතාට ආණ්ඩුව විසින් ලබාදෙන ගජමිතුරු සංග්‍රහයන් හේතුවෙන් ශ්‍රී ලංකන් ගුවන් සේවයේ ලාභදායී අවස්ථාවන් අහිමි වී රාජ්‍ය සම්පත් කොල්ලකෑමක් සිදුවන බව ජාතික නිදහස් පෙරමුණේ නායක විමල් වීරවංශ මහතා අනාවරණය කළේය. මෙම සංග්‍රහයන් ආණ්ඩුවේ ඉහළම පුද්ගලයන්ගේ ඍජු සම්බන්ධතාවයන් ඇතිව සිදුවන බවත්, එය පවුල්වාදයට සමාන ගජමිතුරු වාදයක් බවත් ඔහු පෙබරවාරි 22 වැනිදා පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවකදී චෝදනා කළේය.

වීරවංශ මහතා පවසන පරිදි, ශ්‍රී ලංකන් ගුවන් සේවයේ සභාපති සරත් ගනේගොඩ මහතා ධම්මික පෙරේරා මහතාගේ ආයතනයන්හි ප්‍රධාන තනතුරු දරන්නෙකු බවත්, ඔහුගේ තීරණවලින් රාජ්‍ය සම්පත් පෞද්ගලික සමාගම්වලට හුවමාරු වන බවත් ය.

ශ්‍රී ලංකන් ගුවන් සේවයේ සභාපති සරත් ගනේගොඩ මහතා ධම්මික පෙරේරා මහතාගේ හේලිස් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු බව සඳහන් කළ වීරවංශ මහතා, ඕස්ට්‍රේලියාවට ලාභදායී ගුවන් ගමන්වාරයක් ශ්‍රී ලංකන් ගුවන් සේවයට ලබාගැනීමට තිබූ අවස්ථාව ‘‘ජෙට්ස්ටාර් සමාගමට’’ ලබාදීම ගැන තොරතුරු අනාවරණය කළේය.

"ඕස්ට්‍රේලියාවට යනවා ලංකාවෙන් ගුවන් ‘ඩිරෙක්ට් ගුවන්යානා ශ්‍රී ලංකන් එයාලයින් දෙකක්. ඒ දෙකම ලාභදායී ගුවන් ගමන්. තව එකක් යවන්න පුළුවන්කම තියෙනවා. ඒත් ලාභදායි. මේ යෝජනාව ආවම

සරත් ගනේගොඩ ප්‍රතික්ෂේප කරනවා මේක. ප්‍රතික්ෂේප කරලා මොකද කරන්නේ? ඕස්ට්‍රේලියාවේ 'ජෙට්ස්ටා' කියන සමාගමට දෙනවා ඒ ගමන," යි ඔහු පැවසීය.

ජෙට්ස්ටාර් සමාගමේ දේශීය නියෝජිතයා ලෙස ධම්මික පෙරේරා මහතාගේ සමාගම ක්‍රියාකරන බවත්, මෙම තීරණයෙන් ශ්‍රී ලංකන් ගුවන් සේවයට ලැබිය යුතු ලාභයන් ධම්මික පෙරේරා මහතාගේ සමාගම්වලට හුවමාරු වී ඇති බවත් ඔහු අවධාරණය කළේය. තවද, ගුවන් ටිකට් විකුණුම් සහ වාණිජ්‍ය පහසුකම් සැපයීමද හේලිස් සමාගමට ලබාදී ඇති බව සඳහන් විය.

කිංග්ස්බරි හෝටලයේ ඉඩම සම්බන්ධයෙන්ද ගැටලුකාරී තොරතුරු අනාවරණය විය. ධම්මික පෙරේරා මහතාගේ සමාගමට අයත් මෙම හෝටලය සඳහා රජයේ ඉඩම අඩු කුලියකට ලබාදී ඇති බවත්, රජයේ තක්සේරුවට අනුව එම ඉඩමේ වටිනාකම රුපියල් කෝටි 32.5ක් බවත් වීරවංශ මහතා පැවසීය. "දැන් මේ 2026 මේ ප්‍රශ්නය කලින් ගත්තු තීරණය එක්ක බැඳිලා ආපු නිසා දැන් සාකච්ඡා කරනවා මොකක්ද කරන්නේ කියලා. දැන් ධම්මිකගේ සමාගම පැත්තෙන් ඒ සාකච්ඡාවට එන්නේ කවුද? ශ්‍රී ලංකේ සභාපති සරත් ගනේගොඩ එයා ශ්‍රී ලංකන් එකේ සභාපති. මේ හෝටලේ ප්‍රශ්නය මතු වුනාම ගෙවන කුලිය ගැන... කිංග්ස්බරි හෝටලේට ඉඩම වෙනුවෙන් ගෙවන කුලිය ගැන ප්‍රශ්නය මතු වුනාම ධම්මිකගේ සමාගම වෙනුවෙන් ආණ්ඩුවේ නියෝජිතයන් සමඟ සාකච්ඡාවට එන්නෙත් ශ්‍රී ලංකන් එකේ සභාපති සරත් ගනේගොඩ," යි ඔහු කීය.

ජනාධිපති ලේකම්ගේ බිරිඳ ආයෝජන මණ්ඩලයේ වැඩබලන සභාපතිනිය ලෙස පත්කිරීමත් මෙම සංග්‍රහයන්ට සම්බන්ධ බව ඔහු පෙන්වා දුන්නේය. එම මහත්මිය ධම්මික පෙරේරා මහතාගේ පෞද්ගලික ලේකම්වරියක ලෙස කටයුතු කර ඇති බවත් සඳහන් විය.

මෙම ගජමිතුරු සංග්‍රහයන් රටේ ආර්ථිකයට හානිකර බවත්, ජනතා විමුක්ති පෙරමුණේ සාමාජිකයන්ගේ බලාපොරොත්තුවලට පටහැනි බවත් ඔහු අවධාරණය කළේය.

"ධම්මික පෙරේරලාගේ ගෙදර ගිහිල්ලා රෑට දිනනතුරු සිල්වා ඩිනර් ගන්නවා. ඒක වෙන කතාවක්. කුමාරවරුත් සමහරු දිනපතා යනවා නිතිපතා," යි වීරවංශ මහතා පැවසීය.

ආණ්ඩුව මෙම චෝදනාවලට ප්‍රතිචාර දක්වා නොමැති අතර, මෙම සිදුවීම් රාජ්‍ය සම්පත් අයුතු ලෙස භාවිතය පිළිබඳ පරීක්ෂණයක් අවශ්‍ය බව විපක්ෂයේ මතයයි.

## *එම මාධ්‍ය හමුව අමතමින් විමල් වීරවංශ මහතා*

## *කරනු ලැබූ සම්පූර්ණ දේශනය මෙසේය.*

සුභ උදෑසනක් මාධ්‍යවේදී ඔබ දෙනාට. අද මා සමඟ මාධ්‍ය සාකච්ඡාවට සම්බන්ධ වෙනවා ජාතික නිදහස් පෙරමුණ වෙනුවෙන් කැස්බෑව නගර සභාවේ ජාතික නිදහස් පෙරමුණේ හිටපු නාගරික මන්ත්‍රී, ඒ වගේම ජාතික නිදහස් පෙරමුණේ පුත්තලම් දිස්ත්‍රික් සංවිධායක අතුල සේනායක සහෝදරයා. ඒ වගේම හෝමාගම ප්‍රාදේශීය සභාවට ජාතික නිදහස් පෙරමුණ නියෝජනය කරමින් තරග කරපු කමල් ප්‍රීශාන්ත ගුණවර්ධන සහෝදරයා මාධ්‍ය සාකච්ඡාවට මා සමඟ සම්බන්ධ වෙනවා.

මූලික කාරණා දෙකක්. එකිනෙකට බැඳුනු මූලික කාරණා දෙකක් පිළිබඳව මේ රටේ පොදු ජනතාවගේ අවධානය ඔබ මගින් යොමු කිරීම සඳහායි මෙම විශේෂ මාධ්‍ය සාකච්ඡාව අද අපි කැඳවනු ලැබුවේ.

පළමු එක තමයි ආදෝලනයට තුඩුදී තිබෙන, ආණ්ඩුවට කටඋත්තර නැතිවී තිබෙන මේ රටේ මෑත ඉතිහාසයේ සිදුවෙච්ච ලොකුම වංචාව සහ ලොකුම හානිය සිදු කරනු ලැබීමට නියමිත ‘‘බාල ගල් අඟුරු වංචාව’’ පිළිබඳව අලුත්ම කරුණු කීපයක් ඔබ මගින් මේ රටේ පොදු ජනතාව හමුවට ගෙනයන්න.

අපි දන්නවා මේ ආණ්ඩුව ආපු ගමන්ම ‘‘බාල බෙහෙත්’’ ආවා. ඒ වගේම ‘‘බාල මොඩියුල්’’ ආවා. ඒ විතරක් නෙවෙයි බාලමොඩියුල වලින් නතර වුණේ නැහැ. මුලින්ම ආවා ‘‘බාල ආචාර්ය’’ උපාධිය. ඊට පස්සේ ආවා ‘‘බාල කථානායක’’ කෙනෙක්.

ඒ වගේම මේ ආණ්ඩුව ආපු වෙලේ ඉඳන් ‘‘බාල’’ කතාවලින් අඩුවක් වුණේ නෑ. ඒ විතරක් නෙමෙයි ‘‘බාල වැලිකොට්ට’’ සංවර්ධනයකුත් ආවා. ‘‘බාලගෑස්’’ ටෙන්ඩර්යකුත් ආවා. දැන් මේ රටේ මිනිස්සු ඒ නිසා පෝලිමේ ඉන්න පටන් අරන් තියෙනවා. දැන් ඇවිල්ලා තියෙනවා ‘‘බාල ගල්ලඟුරු’’ ගණුදෙනුව හොරකම තක්කඩිකම පිළිබඳ බරපතල ගැටලුවකට මේ රටේ පොදුජනතාවට මුහුණ දෙන්න සිද්ධ වෙලා තියෙනවා.

පසුගියදා පාර්ලිමේන්තුවට විදුලිබල මණ්ඩලයම ඉදිරිපත් කළා වාර්තාවක්. ඒ වාර්තාව මගින් කියනවා මේ බාල ගල්ගුරු ගණුදෙනුව නිසා දැනට වෙලා තියෙන අලාභය ඔවුන් තක්සේරු කරලා තියෙනවා රුපියල් කෝටි 767ක් කියලා. ඒ කියන්නේ ආසන්න වශයෙන් රුපියල් කෝටි 800ක් කියලා විදුලිබල මණ්ඩලය දැනට තක්සේරු කරලා තියෙනවා, දැනට ගොඩබාන ලද නැව් සංඛ්‍යාවට සාපේක්ෂව.

නමුත් විදුඩබල මණ්ඩලයේ මේ කෝටි 767ක් කියලා කියන්නේ, එහෙම නැත්නම් කෝටි 767.2ක් කියලා කියන්නේ නැව්වාර අටකට අදාළව ගෙන එනලද බාල ගල්ලඟුරු විසින් නියමිත විදුලිය ධාරිතාවය ජනනය කරගන්න නොහැකි වීම මගින්, ඒ නොහැකිවෙච්ච අතිරේක විදුලිය ප්‍රමාණය ජනනය කරන්න වැය වෙන මුදල තක්සේරු කරලා තමයි මේ කෝටි 800 ආසන්න ගාන කියන්නේ.

මම හිතනවා ඔබට පැහැදිලියි, අනිත් කරුණු කිසිවක් පාඩුව සඳහා සලකා බලලා නැහැ. ඒ කියන්නේ මේ බාල ගල්ගුරු නිසා පරිසරයට සිදුවෙන හානිය, නියමිත ප්‍රමාණයට වඩා වැඩියෙන් අලු පරිසරයට එකතු වෙන හානිය, නොරච්චෝලය අවට මිනිස්සුන්ගේ ජීවිතවලට ඒකෙන් වෙන හානිකර බලපෑම, ඊළඟට ඒ බාල ගල්ලඟුරු දිගින් දිගටම පාවිච්චි කිරීම නිසා අනාගතයේදී විදුලිජනනය සිදු කරන ඒ බලාගාරයට වෙන්න පුළුවන් හානිය, ඒකෙන් වෙන්න පුළුවන් පාඩුව, ඒ මඟින් ඒක නැවත පිලිසකර කරන්න ගත වෙන කාලය, ඒ ගත වෙන කාලය තුළ එම 40% විදුලිය ඩීසල් බලාගාර වලින් හෝ ඒ විදිහට ගන්න වුනොත් එහෙම නැත්නම් පවර් කට්එකකට යන්න වුනොත් ඒකෙන් වෙන හානිය මේ එකක් වත් තක්සේරු කරලා නෑ.

මෙතන තියෙන්නේ ගෙනාව නැව් අටයි. අටේම ගල් අඟුරු බාලයි. ඒ බාල ගල් අඟුරු දාලා විදලිය උත්පාදනය කරනකොට නියමිත විදලිය ප්‍රමාණය ජනනය වෙන්නේ නෑ. අඩුවෙන් ජනනය වෙන්නේ. අන්න ඒ අඩුවෙන් ජනනය වෙච්ච ප්‍රමාණය නියමිත ජනනය විය යුතු ප්‍රමාණයෙන් අඩුවෙන් ජනනය වෙච්ච ප්‍රමාණය අඩු කරලා බැලුවම එන පාඩුව තමයි මේ කියන්නේ.

එතකොට අපිට පැහැදිලියි විදුලිබල මණ්ඩලය කියන මේ වාර්තාවේත් කෝටි 800ක් කියන්නේ නැව් අටකට, නියම පාඩුව නෙවෙයි මේකේ ඊට වඩා තුන් හතර ගුණයක් හෝ ඊට වඩා වැඩි ගුණයක් මේකේ පාඩුව විශාලයි. ඒ කියන්නේ නැව් අටකට අදාලව ගත්තන්න. දැන් අපි දන්නවා බාල ගල් අඟුරු නැව් හතරකට අදාලව ගණනය කරාම, දඩ ගැහුවට පස්සේ තියෙන අලාභය කීයද? දැන් ආණ්ඩුව කියනවානේ අපි දඩ ගහලා තියෙනවා කියලාද? දඩ දැන් දඩ ගැහුවට පස්සේ තියෙන අලාභය කීයද? රුපියල් බිලියන දෙකයි හතරකට අදාල අටකට නෙවෙයි. හතරකට අදාලව ආණ්ඩුව ගහනවයි කියන දඩෙන් පස්සෙත් පාඩුව. ඒ කියන්නේ මම අර කියන්නේ මේ පාඩුවත් අර විදුලිය ජනනය කිරීමේ සිදුවෙන අඩු පාඩුව ගැන විතරක් හිතා. ඒ පාඩුව විතරක් රුපියල් බිලියන දෙකකට වැඩියි.

අනිත් එක තමයි මේකේ බරපතලම දේ. පළමු නැව්වාර හතරට වඩා වැඩි පස්වෙනි නැවේ සිට අටවෙනි නැව දක්වා වූ ගල් අඟුරුවල බාල තත්ත්වය. අඩුගානේ මේක පළවෙනි දෙවෙනි නැව එනකොට මේක අනාවරණය වෙනවා. ශ්‍රී ලංකාවේ ''ලැබ් එකෙන් එන රිපෝට් එකේ'' මේක බාලා ගල්අඟුරු කියලා කියවෙනවා. එතකොටවත් අඩු ගානේ ඉන්දියානු සමාගමට බල කරන්න ඕන දකුණු අප්‍රිකාවෙන් හොඳ එක අරන් වරෙන් කියලා. එහෙම කියන්න බැහැ අතයට මහා කෝටි ප්‍රකෝටි ගානක ගනුදෙනුවක් සිද්ධ

වෙච්ච හින්දා. ඒ නිසා ටෙන්ඩරේ ගත්තු ඉන්දිය සමාගම, ඒ බාල සමාගම මොකද කරන්නේ? පළවෙනි නැව් හතර ගෙනාවටත් වඩා "වැඩිපුර බාල ගල් අඟුරු තමයි" පහේ සිට අට දක්වා නැව්වල ගේන්නේ.

ඒකෙන් තේරෙනවනේ... මේ ආණ්ඩුව දැන් මොනවද කාපු රිලව් වගේ තත්ත්වයටනේ වැටිලා තියෙන්නේ. අත යට ගානක් ගත්තේ නැත්නම්, මේකෙන් කෝටි ප්‍රකෝටි ගානක් මාටියා ඇහුවේ නැත්නම් ඒ සමාගමට හයියක් එනවද පළවෙනි හතරටත් වඩා බාල ගල්අඟුරු නැව් පහේ සිට අට දක්වා ගේන්න. එහෙම ගෙනෙද්දිත් පාවිච්චි කරනවද... එහෙම කරන්න වෙලා තියෙන්නේ "කුම්ඹලාමාළු" කාපු හින්දා නෙවෙයිද? ඒක හින්දා නෙවෙයිද? මේ තරම් මගඩියක් මේ රටේ විදලිය පාරිභෝගිකයාගේ පැවැත්ම අනතුරට අවධානමට වට්ටලා විදුලිය පාරිභෝගිකයා මත තව තවත් බර දෙගුණ තෙගුණ සිව්ගුණ පිටින් පටවන්න ලෑස්ති කරගෙන මේ කරන අපරාධය, මේ කරන තක්කඩිකම, මේ කරන හොරකම මෑත ඉතිහාසයේ වෙච්ච සපරාධීම හොරකම. ඒ හොරකම කරපු නිසා තමයි අර ගල් අඟුරු ගේන මිනිහත් කලින්ටත් වඩා බාලා ගල්අඟුරු ගෙනෙද්දී කටවහගෙන ඉන්න සිද්ධ වෙලා තියෙන්නේ කුමරවරු දෙපලට. කවුද මේ  කුමරුවරු.

විදුලිබල කුමරුයි, ජනාධිපති කුමරුයි. කුමරු දෙපලට සිද්ධ වෙලා තියෙනවා ඇහුන් නෑ කිය කිය ඉන්න. දැක්කේ නෑ කිය කියා ඉන්න. ඒ විතරක් නෙමෙයි. දැන් අපි තේරුම් ගන්න ඕනා මේ හිඟ වෙන විදිලිය ප්‍රමාණය ඩීසල් වලින් ජනනය කරන්න ගියොත් කොච්චර විශාල වියදමක් යනවද. එතකොට ඒකේ පාඩුව මේකට අන්තර්ගත වෙන්නේ නැහැ. ඒ කියන්නේ හිඟ වෙන විදිලිය ප්‍රමාණය. අපි දන්නවා නොරොච්චෝල කියන්නේ 40%ක් මුළු විදුලිය ධාරිතාවයෙන්. ඒ හිඟ ප්‍රමාණය ඩීසල් වලින් ගන්න ගියාම ඒ ගානක් මේ පාඩුවේ නෑ.

එතකොට මේ පෙන්නන පාඩුව වගේ කොච්චර තව වැඩි වෙනවද... මේ පාඩුව කියලා අපිට තේරුම් ගන්න පුළුවන්. දැන් ඊයේ වෙනකොට... ඊය පෙරේද වෙනකොට නවවෙනි නැවත් ඇවිල්ලා ගොඩ බානවා. තව නැව් 15ක් එන්න තියෙනවා. එකේ සිට හතරට වඩා ගල් අඟුරු වලට, ඒ බාල ප්‍රමාණයට වඩා පහේ සිට අට දක්වා වැඩිපුර බාල නම් එතන සිට ඉදිරියට තව කොච්චර බාලවේවිද. මෙහෙම දිගින් දිගටම එදාටත් වඩා කලින්ටත් වඩා වැඩිපුර බාල ගල් අඟුරු ගෙනල්ල ගෙනල්ලා නොරොච්චර බරාගාරය ක්‍රියාත්මක කිරීමට යාමෙන් පරිසරට වෙන හානිය කොච්චරද. බලාගාරයට වෙන හානිය කොච්චරද. බලාගාරය අක්‍රිය වුනොත් මාස හයක් යනවා හදන්න. අඩුම මාස හයක් යනවා. ඒ හදන්න යන වියදම කොහෙන්ද අරගන්නේ?

බලාගාරය අක්‍රිය වුනොත් ඒ ඒ විදුලිබල ධාරිතාවය ගන්න වෙන්නේ ඩීසල් මාෆියාවෙන්. ඒකට ගෙවන්න වෙනවා මේ වගේ දහස් ගුණයක්. ඊටත් වඩා වැඩිගුණයක්. එතකොට එහෙම ගෙවලා ගත්තම මේ බර කාගේ පිටද පටවන්නේ? ඔබත් මමත් ඇතුළුව මේ රටේ සාමාන්‍ය විදුලිබල පාරිභෝගිකයාගේ. අද මේ රටේ කර්මාන්ත වැහෙනවා. මාස් (MAS) කියලා තියෙනවා ප්‍රධාන ඇඟලුම් කර්මාන්ත ශාලාවක්. ඒගොල්ලෝ දැන් එක එක වහගෙන වහගෙන වහගෙන යනවා. තුල්හිරියේ තිබ්බ්ච ප්‍රධාන ඇඟුලුම් කර්මානන්ත ශාලාවකුත් වැහුවා. ඇයි වහන්නේ? මේ රටේ විදිලිය පිරිවැඩියි.

දැන් ඇමෙරිකානු බදුනම් දැන් ඔය ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවත් එක්ක හැමෝටම 15% වුණානේ. නමුත් ඊට වඩා මේකේ පිරිවය වැඩියි. විදුලිබල පිරිවැය වැඩියි. රට ඇතුලේ ගහන බදු ප්‍රමාණය වැඩියි. නිෂ්පාදන පිරිවය වැඩියි. ඒ නිසා ලෝක වෙළඳ පොළත් එක්ක තරග කරන්න බැහැ ලංකාවේ කර්මාන්තශාලා තියාගෙන. ලංකාව අවුරුද්දකට ඇගලුම්වලින් හම්බ කරනවා බිලියන් පහක්. ඇඟුලුම් වලින්... ඒකෙන් දෙකක්ම පමණ හොයන්නේ මේ කියන ''මාස් හෝල්ඩින්ස්'' සමාගම. දැන් ඒගොල්ලෝ ගලවාගෙන යනවා. මෙහි කර්මාන්තශාලා 38ක් විතර තියෙනවා එයාලයි. ඒවා එක එක එක එක දැන් ගලවගෙන යනවා. එතකොට මේකෙන් පේන්නේ මොකක්ද?

ඒකෙන් පේන්නේ මේ බාල ගල්අඟුරු ගෙනල්ලා මේ වැඩේ කිරීමෙන් වෙන හානියෙන් තවත් විදුලිය පිරිවැය ඉහළ යනවා නිෂ්පාදන පිරිවැය වැඩිවෙනවා. මේ රටේ ඉතුරු වෙලා තියෙනවා නම් පණ ඇද ඇද ඉන්නවා නම් කර්මාන්තශාලා කීයක් හරි, ඒ ටිකත් මේක හේතු කොටගෙන නැත්තටම නැති වෙනවා. එදා විදුලිය පරිහරනය කරපු, එහෙත් දැන් විදුලිය පරිභෝජනය නොකරන ගෙවල් සංඛ්‍යාව දැනට තියෙනට වඩා දහගුණයකින් 100 ගුණයකින් වැඩි වෙනවා. මේ මේ නොරොච්චෝල හොරකම විසින් ඇති කරන ඇති කරන ප්‍රතිඵලය හේතු කොටගෙන .

දැන් බලන්න පළවෙනි වතාවටනේ මේ ගල් අඟුරු හොරකම ගැන ප්‍රශ්නය ආපු ගමන් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්, ''ඉන්දියානු ව්‍යාප්තවාදය'' කියන පන්තිය ''දැන් අප හකුලා ඇත'' කියන ප්‍රකාශය පහු ගියදා, ඉන්දියාවේ ගිහිල්ලා ආපු ගමන් ටිල්වින් සිල්වා නිකුතු කළේ. ටිල්වින් කියන්නේ (till win) දිනන තුරු... ''දිනන තුරුරු සිල්වා'' ඔහු මොකක්ද කිව්වේ? දිනන තුරු සිල්වා කියනවා... ඒ ගල්ඟුරු බාල හින්දා ඇමතිතුමා අයින් වෙන්න ඕනේ නෑ ලු. අන්න බලන්න දිනන තුරු සිල්වා මේකට එහෙම ඉදිරිපත් වෙන්නේ ඇයි? මේක විපක්ෂයේ සමහරු මේක පටු කරන්න හදනවා. විදුලි බලමතිගේ පමණක් හොරකමක් හැටියට. නෑ මේක දිනන තුරු සිල්වයි කුමාරවරු දෙදෙනයි. තුන්දෙනාගේම ඒකාබද්ධ හොරකමක්.

දිනනතුරු සිල්වා ඒ නිසා තමයි පාදයක් ඉදිරියට තියලා විදුලි බල ඇමතිව රැක්කේ.... නෑ ගල් අඟුරු බාල වුනාට ඇමති බාල නෑ... එයා ඉන්න ඕනේ කියලා. නැත්නම් දිනන තුරු සිල්වා ඔය වගේ ඒ කුණකට කරගහන්න එහෙම ඉදිරිපත් වෙන්නේ නැහැ. මේ නිසා මේ මහා හොරකම මේ මහා මූල්‍ය අපරාධය නිකන් තනි මිනිහෙක්ගේ මූල්‍ය අපරාධයක් නෙවෙයි. විදුලිබල කුමාරගේ විතරක් තීරණයක් නෙවෙයි. දිනනතුරු සිල්වයි කුමාරවරු දෙදෙනයි එකට එකතු වෙලා කරපු හොරකමක්. ඒ නිසා මේක තේරුම් ගන්න ඕනා. සුළු පටු හොරකමක් නෙවෙයි. මේකේ වගකීම නිකන් එක කුමාර කෙනෙකුට, ඉලෙක්සිටි කුමාරට විතරක් පවරලා අත හෝදගන්න බෑ.

ඒ නිසා තමයි දැන් ගනම් බලන්නකෝ... විදුලි කුමාරගේ වැඩේ ගැන ජනපති කුමාර මුකුත් නැහනේ. සද්ද නෑනේ. මුකුත් කියන්නේ නෑනේ.

වෙනද නම් ඔහොම එකක් ආපු ගමන් චණ්ඩියා වගේ එනවා පාර්ලිමේන්තුවට. ගාමිණී ෆොන්සේකා වගේ ඇවිල්ලා බල්ටියක් ගහනවා. බල්ටියක් ගහලා ''සිගරට් එකක්'' පත්තු කරගෙන මල් ගහක් වටේ රවුමක් ගහලා පිම්මක් පැනලා ලොකු ලොරිටෝක් එකක් දෙනවනේ. කෝ එතකොට ඒ කුමාරයා දැන් නෑනේ. මේ මේ රටේ දැන් අද තියෙන ලොකුම ආන්දූන් කුන්දූන් වෙච්ච ප්‍රශ්නය... හොයාගන්න නෑ. හොයාගන්න නැහැ. නෝකතා නෝසිනා. ඇයි? ඔක්කොම මේ කුම්ඹලා මාළු කාලා තියෙන්නේ. දැන් ඉතින් දිරව ගන්න බැරුව ඉන්නවා බළල්ලු තුන්දෙනා. දිනුතුරු සිල්වයි, කුමාරවරු දෙපලයි.

ඒ නිසා අපි මේක මේ රටේ බුදු ජනතාවට කියනවා... 76 වසරක එක කුමාරයෙක්වත් මේ වගේ ගැහිල්ලක් ගැහුවේ නෑ. 76 වසරක එක කුමාරයෙක්වත් 78 වසර ආපු මේ කුමාරයෝ දෙන්නයි දිනනතුරු සිල්වයි තමයි මේ වැඩේ කරේ. ඒ නිසා හොරකන් නවත්තලා, හොරු හොරුකම් කරපු සල්ලි ගෙනල්ලා, රට හදනවයි කියලා පාරන් බාලා, කොහෙද මම දන්නේ නෑ රටක තියෙන සල්ලිත් ඔක්කොම ගෙනල්ලා, අර කවුද අර පානදුරේ නෝනා. එහෙම කියලා මිනිස්සු චූන් කරලා බලාපොරොත්තු හදලා පාරම්බාලා කයිවාරු කෙලලා ගත්තු ආණ්ඩුව අවුරුද්ද යනකොට දෙයි හාමුදුරුවනේ, මහදවල් මේ රටේ ගල්ලඟුරු ටෙන්ඩර් එකෙන් කෝටි ප්‍රකෝටි ගානක් හොරකම් කරලා අද ඉන්නවා සද්ද නැතුව. දිනනතුරු සිල්වයි මේ සෙට් එක ඔක්කොම. ඒ නිසා අපි තේරුම් ගන්න ඕනා මේක තුච්ච රොබරියක්.

මේ බර විදුලිය පාරිභෝගිකයාට පැටවෙන එක වළක්වන්න බැහැ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ක්‍රිස්ටිනා ඇවිල්ලා උම්මා දෙනවා. උම්මා දෙන ගමන් එයා කියන්නේ.... මේවයි ඔක්කොම බර දෙන්න මහජනයාට. එයා කියනවා අපි කිච්චටත් වඩා බර මහජනයට දීලා. අපි කිච්චටත් වඩා බදු ආදායම වැඩි කරගෙනුලු. කොහොමද වැඩේ? මේවා ඔක්කොම බදු අඩු කරලා මහජනයාට සහන දීලා වැට් එක ඉස්කෝල පොත් වලින් අයින් කරලා, බෙහෙත් වලින් වැට් එක අයින් කරලා අධ්‍යාපන උපකරණ වලින් වැට් එක අයින් කරලා ඇට්ටි හැලෙන කතා ටිකක් කියලා ඇවිල්ලා දැන් ක්‍රිස්ටිනා නෝන ඇවිල්ලා කියනවා... හොඳ පුතා. රනිල්ටත් වඩා හොඳයි. අපි කිච්චටත් වඩා බදු ගහලා ආදායම වැඩි කරගෙන කියලා.

දැන් මේ බර එන්නේ කාටද? මේ හොරකමේ බරත් එන්නේ ක්‍රිස්ටිනා උම්ම දීලා කියන්නේ... උඹලා හොරකම් කරාට කමක් නැහැ... බර දීපන් මහජනයට කියලා. මේ බර පටවන්නේ මහජනයට. ඒ නිසා අපි තේරුම් ගන්න ඕනා, ඒ ක්‍රිස්ටිනාගේ උම්මි අරන් චූන් වෙලා, මේ බර මහජනයට පටවන්න ආවොත් එදාට තමයි ''ආණ්ඩුව ගෝ හෝම්'' කියන සටන් පාඨේ මහපාරට එන්නේ. ඒක වළක්වන්න බැහැ. මුළු රටම පාරට බහින එක වළක්වන්න බැහැ. අපි මේ රටේ ජනතාවට සූදානම් වෙන්න කියනවා. මේ තක්කඩි රැල දිනනතුරු සිල්වයි කුමාරවරු දෙපලයි. එකට එකතු වෙලා මේ කරපු හොරකමේ සම්පූර්ණ බර මේ රටේ විදුලිය පාරිභෝගිකයා මත දශම එකකින්වත් පටවන්න එන දවසට තමයි මුළු රටම පාරට බැහැලා දිනනතුරු සිල්වට දුවන්න දුවන්න වෙන තත්ත්වයක් ඇතිවෙන්නේ.... කුමාරවරු දෙන්නත් කිහිල්ලේ ගහගෙන.

අනික මේ හොරකම කරන්නේ මේ හොඳට දුවන රටක නෙවෙයිනේ. ගත්තේ අමාරුවෙන් දුවන රටක්නේ. මේ අපි මේක බඩෙක් දරුවෙක් බලාගන්නවා වගේ ලෙඩෙක් බලාගන්නවා වගේ බලාගන්නන්නේ කිව්වේ. නිකන් නිරෝගී මිනිහෙක්ව බලාගන්න නෙවෙයිනේ ආවේ. ලෙඩෙක් බලාගන්න ඇවිත් යකෝ ලෙඩගේ සාක්කුවටත් කෙළිනවනේ. මේක පුදුම කෙළියක්නේ. යමක් කමක් තියෙන මිනිහෙක්ව බලාගන්න ඇවිල්ලා ඔන්න ඒකෙන් මාටියා ගහන එකට වඩා භයානකයි. සතේ අතේ නැතුව පාන් කියාගන්න බැරුව තියෙන රටකට ඇවිල්ලා ඒකෙන් මාටියා ගහන එක. මෙන්න ඒක තමයි පාපතර මාටියා ගැහිල්ල. ඒක තමයි නරකම හොරකම. දැන් මේ කරන්නේ නරක හොරකම. මේකට මේකට මේ ශාප වෙන හොරකමක් වළක්වන්න බැහැ.

ඒ කියන්නේ අර ගෙදර තියෙන බත්මුට්ටියේ දංකුඩේ.... දරුවන්ට කන්න තියෙන දංකුඩේ හූරන් කනවා වගේ හොරකමක්. ඒ වගේ සාපරාධි හොරකමක් මේ රැල මේ කරන්නේ. ඒ නිසා මේ කම්බහොරුන්ට හොර දිනනතුරු සිල්වා සහ හොර කුමාරවරු දෙපල එකට එකතු වෙලා කරපු මේ හොරකමට තවදුරටත් ඉඩදිය යුතු නෑ. මේ රටමේ ඇදගෙන යන්නේ දිනතුරු සිල්වයි, කුමාරවරු දෙපලයි. ගල් අඟුරු හොරකමෙන් මේ රට ඇදගෙන යන්නේ ගල් යුගයට. දැන් පාර්ලිමේන්තුවක් ගෙනිච්ච ගල් යුගයට. මේ රටම ඇැදගෙන යන්නේ ගල් අඟුරු හොරකමෙන් ගල් යුගයට. ඒ කියන්නේ විදුලිය නැති. විදලිය පරිභෝජනය කළ නොහැකි ගල් යුගයට.

දැන් දැනටමත් ගෑස් පෝලිමේ ලගින්න වෙලා තියෙනවනේ. මේවා නැති. ඩොලර් හිඟ ගකගකමෙන් නැති වෙලා නෙමෙයි. කරපු හොරකම නිසා නැතිවෙලා. ටෙන්ඩර් එකෙන් මාටියා ගහන්න ගිය නිසා නැතිවෙලා. අන්න ඒ ඒ ඉරණමට ගල් යුගයට මේ රට වැටෙන එක. ඒ කාලේ තිබ්බේ "ඇලපාත" මුදලිලා. දැන් මේ ආණ්ඩුවේ ඉන්නේ "ගලපාත" මුදලිලා. මේ ගලපාත මුදලිට මේ රටේ ගල් අඟුරු බාල ගල්ුරු ගෙනල්ලා ගල් අඟුරු වලින් හොරාලා ජාතිය ගල්යුගයට ගෙනියන්න ඉඩ දිය යුතු නෑ. මේ රටේ පොදු ජනතාව ඊට එකඟ වෙන්නේ නැහැ. ඊට එරෙහිව තීරණාත්මකව පෙළ ගැසිය යුතුයි. ඊට එරෙහිව සියළුම ජනතාව එක්ව පියවර ගත යුතුයි. මොකද මේක ජන සමාජයේ සෑම තීරුවකටම බලපානවා. සෑම තීරුවකටම මේ බර පැටවෙනවා. ජන සමාජයේ සෑම තීරුවකටම කාන්දු වෙන බරක්. බලපාන ප්‍රශ්නයක්.

මේක වෙන කවුරුවත් කරපු පවක් නෙවෙයි. මේක "දිනනතුරු සිල්වයි කුමාරවරු දෙන්නයි" එකතුවෙලා හවුලේ කරපු හොරකමක්. මේ හොරකම කරපු සියලු දෙනාට දඬුවම් කළ යුතුයි. පන්නා දැමිය යුතුයි. අපි ජනතාවට කියනවා අන්න ඒ අභියෝගය බාරගන්න සූදානම් වෙන්න කියලා.

## ***ඒ වගේම මේක තවත් කාරණාවක්...***

ශ්‍රී ලංක් ගුවන් සේවයේ සභාපති අපි දන්නවා සරත් ගනයේගොඩ. එයා තමයි දැනට ශ්‍රී ලංක ගුවන් සමාගමේ සභාපති. දැන් ආයෝජන මණ්ඩලයේ වැඩ බලන සභාපතිනිය බවට පත් කරන්න යනවා ජනාධිපති ලේකම්වරයාගේ බිරින්දෑ... එතුමිය මීට කලින් ධම්මික පෙරේරාගේ පෞද්ගලික ලේකම් හැටියට වැඩ කරලා තියෙනවා. එතකොට ධම්මික පෙරගේ ගෝලයෙක් තමයි ශ්‍රී ලංකන් එකේ සභාපති හැටියට ඉන්නේ. සරත් ගනේගොඩ.

දැන් අපි දන්නවා ධම්මික පෙරේරගේ ආයතනයකට තමයි තියෙන්නේ ''කින්ග්ස්බරි හෝටලය'' ඒ ඉඩම අකර 5.5යි. කාර් පාක් එක වෙනම තියෙනවා අකරයක්. ඉතා වටිනා වාණිජ ඉඩමක්. මේ ඉඩම අයිති රජයට. මේකට මෙතෙක් කලක් මේ හෝටලේ පවත්වාගෙන ගිය ආයතනය, සමාගම අක්කර පහමාරටම අවුරුද්දට ගෙව්වේ රුපියල් ලක්ෂ 20 යි. අක්කරයක් වෙනුවෙන් මාසිකව රුපියල් 33,000යි. දැන් පහුගිය කාලේ මේ මුදල ඒ කියන්නේ රනිල්ගේ ගේ ආණ්ඩුව කාලේ හිටපු සංචාරක ඇමතිවරයා මේ මුදල 2026 ඉඳන් බලපැවැත්වෙන පරිදි වසරකට මිලියන 5ක් දක්වා වැඩි කළා. කලින් තිබ්ච්ච ගානට වඩා පොඩ්ඩක් වැඩි කළා. ඒක නෙවෙයි ඇත්ත වටිනාකම ඒක නෙවෙයි. නමුත් තිබුනට වඩා පොඩ්ඩක් වැඩි කළා.

රජයේ තක්සේරුවට අනුව මේ ධම්මික පෙරේරගේ සමාගමට අයිති මේ වාණිජ්‍ය ඉඩම ඇතුලේ ගොඩනගලා තියෙන හෝටලය. ඒ ඉඩම තක්සේරුව තියෙනවා රජයේ තක්සේරුවට අනුව රුපියල් කෝටි 32.5ක්. ඒ කියන්නේ ගෙවන්න ඕන. ල් කෝටි 32.5ක්. දැන් මේ 2026 මේ ප්‍රශ්නය කලින් ගත්තු තීරණය එක්ක බැඳිලා ආපු නිසා දැන් සාකච්ඡා කරනවා මොකක්ද කරන්නේ කියලා.

දැන් ධම්මිකගේ සමාගම පැත්තෙන් ඒ සාකච්ඡාවට එන්නේ කවුද? ශ්‍රී ලංකේ සභාපති සරත් ගනේගොඩ එයා ශ්‍රී ලංකන් එකේ සභාපති. මේ හෝටලේ ප්‍රශ්නය මතු වුනාම ගෙවන කුලිය ගැන... කින්ගස්බරි හෝටලේට ඉඩම වෙනුවෙන් ගෙවන කුලිය ගැන ප්‍රශ්නය මත්තු වුනාම දම්මිකගේ සමාගම වෙනුවෙන් ආණ්ඩුවේ නියෝජිතයන් සමඟ සාකච්ඡාවට එන්නෙත් ශ්‍රී ලන්කන් එකේ සභාපති සරත් ගනේගොඩ.

ඊට පස්සේ දැන් මේ ගාන පුලුවන් තරම් අඩු කරගන්න... දැන් කිනග්ස්බරි එකේ තියෙනවා වී වී අයි පී රූම් එකක්... මේකට රජයේ ඇමතිවරු නියෝජ්‍ය ඇමතිවුරු නිලධාරින් එක එක කට්ටිය ගෙනල්ලා දිනපතා රාත්‍රීවල ප්‍රිය සම්භාෂණ යනාදී නානා ප්‍රකාර දේවල් නානා සංඥා, ඒවා එක එක ඒවා වෙනවා ඒක ඇතුලේ. තමුන්නාන්සේලාට මාධ්‍යවේදීන් හැටියට පැපරාශි ක්‍රමයකට යන්න පුළුවන් නම් බලාගන්න පුළුවන් වී වී අයි පී රූම් එකට රිංගන කට්ටිය යනකොට ඉන්න හැටියයි එනකොට එන හැටියි.

ඉතින් සරත් ගනේගොඩ ධම්මිකගේ හේලිස් අධ්‍යක්ෂ මණ්ඩලය ඉන්නේ. එයා එන්නේ සාකච්ඡාවට. දැන් මේ ශ්‍රී ලංකන් එයාලයින එකේත් ඉන්න සභාපති. ඔය සරත් ගනේගොඩ ධම්මිකගේ හේලිස් එකේ ඉන්න ප්‍රධානියා බව ඔබ දන්නවා. දැන් ඕස්ට්‍රේලියාවට යනවා ලංකාවෙන් ගුවන් ''ඩිරෙක්ට් ගුවන්යානා ශ්‍රී ලංකන් එයාලයින් දෙකක්. ඒ දෙකම ලාභදායී ගුවන් ගමන්. තව එකක් යවන්න පුළුවන්කම තියෙනවා. ඒත් ලාභදායි. මේ යෝජනාව ආවම සරත් ගනේගොඩ ප්‍රතික්ෂේප කරනවා මේක. ප්‍රතික්ෂේප කරලා මොකද කරන්නේ? ඕස්ට්‍රේලියාවේ ''ජෙට්ස්ටා'' කියන සමාගමට දෙනවා ඒ ගමන. ඒ අන්න අර ශ්‍රී ලංකන් එකට ආපු චාන්ස් එක ජෙට්ස්ටා කියන සමාගමට දෙනවා ඒ ගුවන් ගමන යන්න. ඒකෙන් මොකද වෙන්නේ? ජෙට්ස්ටාර් එකේ දේශීය නියෝජිතයා කවුද? ධම්මික පෙරේරා. එයාගේ සමාගම.

දැන් ධම්මික පෙරේරගේ ගෝලයා සභාපති ගනේගොඩ. ඕස්ට්‍රේලියාවට යනවා ශ්‍රී ලංකන් එකේ ගමන් වාර දෙකක් ''ඩිරෙක් ෆ්ලයිට්''. ඒක මාර ලාභයි. තව එකක් යන්න පුළුවන්. ඒ තරම් මගීන් ඉන්නවා. ඒ අවස්ථාව ශ්‍රී ලන්කන් ගන්නේ නැතුව, ශ්‍රී ලන්කන් එකේ ෆ්ලයිට් එකක් වෙන කොහෙද තුතු කුඩියකට යවලා ධම්මික පෙරේරගේ සමාගම දේශීය නියෝජිතයා වෙච්ච, ජෙට්ස්ටාර්ට දෙනවා අර ලාභදායී තුන්වෙනි ගුවන් ගමන්වාරය.

ගුවන් ටිකට් පත් විකුණන්නේ හේලිස්. ගුවන් සේවය සඳහා කරන වාණිජ්‍ය පහසුකම් සියලු සැපයිම් කරන්නේත් හේලිස්. ඒ ඔක්කොම සල්ලි පොම්ප වෙන්නේ... රටට එන්න ඕන මොන මේ සල්ලි ප්‍රමාණය උරාගන්නේ හේලිස් හෙවත් ධම්මික පෙරේරලා. දැන් මේ ගජමිතරු ධනවාදය නෙවෙයිද? මේක මේ පවුල්වාදයට වඩා සනීපද? පවුල්වාදයත් ගජමිතුරු වාදයත් අතර තියෙන වෙනස මොකක්ද?

ධම්මික පෙරේරලාගේ ගෙදර ගිහිල්ලා රෑට දිනනතුරු සිල්වා ඩිනර් ගන්නවා. ඒක වෙන කතාවක්. කුමාරවරුත් සමහරු දිනපතා යනවා නිතිපතා. නමුත් එහෙම කරලා මේ රට මේ රටට එන්න ඕන මුදල් මෙහෙම කොල්ලගන්න දෙනවද මේ ගජමිතුරුන්ට? ද මේ රට දුවන්නේ ගජමිතුරුවරු පස්ස හය දෙනෙක්. බලන්නකෝ ඩඩ්ලි මහත්තයා කියනවා මේ ආණ්ඩුව තියාගන්න ඕනාලු. මේක සුපිරි ආණ්ඩුවක්. ඔව්නේ යකෝ. මෙහෙම ඉතින් හාල් වල ලාබරේට්ටුව වැඩි කරගන්න වෙන මොකාද ඉඩ දුන්නේ? අයියා මෛත්‍රීවත් දුන්නේ නෑ එහෙම චාන්ස් එකක්.

ඒ හින්දා ඩඩ්ලි සහෝදරයාට අනුර සහෝදරයාගේ ආණ්ඩුව, ටිල්වින් සහෝදරයාගේ ආණ්ඩුව, මෛත්‍රීපාල සහෝදරයාගේ ආණ්ඩුවට වඩා සුපිරි. ඒකනේ කිව්වේ... අර රෝල්ස් රොයිස්ද ජෙට්ද අරකද මේකද මොනවද නොගෙනෙන්නේ? රත්නයි.... රත්නත් කිව්වනේ මේ ජනාධිපතිතුමා මීට කලින් ආවා නම් මේ රට මීට වඩා හොඳයි කියලා.

එහෙනම් දැන් ජෙට් හයක් විතර තියෙනවා මුන්දලට. ඩඩ්ලිට ජෙට් හයයි, රත්නට ජෙට් හයයි. මේකෙන් ජේනවා අද තාම ගොවියා කුඹුරේ. රුපියල් 70යි 75යි වී මිල. ඒ නිසා මේ මොකක්ද මේ ගජමිතුර ටික සතුටු කරන්නේ. දැන් ජනතා විමුක්ති පෙරමුණේ අර කේඩරේ ඉන්න පූර්ණ කාලීන මිනිස්සු

බලාපොරොත්තු වුණේ ධම්මික පෙරේරා වගේ ප්‍රකෝටිපතියෝ ඩලිලා වගේ ප්‍රකෝටිපතියෝ සතුටු කරන පිනවන ගමනක්ද? දුප්පත් මිනිහාගේ කරට බරපිට බර පටවලා. හුස්ම ගන්න බැරි වෙන්න බදුපිට බදු පටවලා, දරාගන්න බැරිවෙන විදිහට ජීවන තත්ත්වය හිර කරලා, ඒ ඔක්කොම කරන ගමන් අර සුපිරි ගජමිතුරු ටිකට තරවෙන්න පාර කපලා දීපු එකද මේ රටේ ජනතා විමුක්ති පෙරමුණේ ජයග්‍රහණය වෙනුවෙන් සැහෙන කාලයක් තිස්සේ පූර්ණ කාලිනව කැපවෙච්ච මිනිස්සු බලාපොරොත්තු වුණේ.

ඒ නිසා මේ යන්නේ ඉතාම ද්‍රෝහී ගමනක්. අපි මේ රටේ පොදු ජනතාවගෙන් විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණේ දැවැන්ත කැපවීමක් කරන සාමාජිකයගෙන් ඉල්ලනවා. කරුණා කරලා භක්තිවන්ත නොවී, යථාර්ථවාදීව මේ කෙරෙන දුෂ්ට ක්‍රියාධාමය දිහා බලලා මේක වෙනස් කිරීම සඳහා ඉදිරිපත් වෙන්න ක්‍රියාත්මක වෙන්න පෙරමුණගන්න කියලා අපි ඔවුන්ගෙන් ඉල්ලා සිටිනවා.

මේ කාරණා දෙක තමයි අපිට ඔබට ඉදිරිපත් කරන්න තියෙන්නේ ප්‍රශ්න මීට අදාලව අහන්න පුළුවන්.